<u>මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය-2010</u>

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1:1. <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා ව ජාතික මධ්‍යස්ථානයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යසථානයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1:2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1:2:1. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

අ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලා කාමර වෙන්කිරීම්, ජාල කළමණාකාර කාර්යාලය වෙන්කිරීම හා පුස්තකාලය වැඩිදියුණු කිරීම් සඳහා වැය කරන ලද රු 339,931 ක් ප්‍රාග්ධනිත කරනු වෙනුවට අයභාර වැය ලෙස ආදායමෙන් ලියා හැර තිබුණි.

1:2:2. <u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ<br>I. 7.4.1 ජේදය | 2010 වර්ෂය සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටු රැසවීමක් පමණක් පවත්වා තිබූ අතර එම රැස්වීම සඳහා නිරීක්ෂකයකු සහභාගී කරවන ලෙස විගණකාධිපතිවරයා දැනුවත් කර නොතිබුණි. |
| II. 5.1.2 ජේදය | සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පහත අංගයන් එහි ඇතුලත් කර නොතිබුණි.<br>I. ආයතනය සතු සම්පත්<br>II. ආයතනය සතු ශක්තීන්, දුර්වලතා, අභියෝග සහ අවස්ථා පිළිබඳ විශ්ලේෂණයක්(SWOT analysis)<br>III. පසුගිය වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක්<br>IV. අරමුණු හා ඉලක්ක ඉටුකිරීම සම්බන්ධයෙන් කළමනාකරණයෙ වගකීම් පැහැදිලිව දැක්වෙන පරිදි සකස් කළ ක්‍රියාකාර් සැළැස්ම<br>V. කාර්ය සාධක දර්ශකයන් |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මධ්‍යස්ථානයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල අතිරික්තය රු.435,775 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.212,238ක් විය. මේ අනුව අතිරික්තයේ රු. 223,537 වැඩිවීමක් නිරීක්ෂණය විය.

2:2. <u>කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) <u>ශිෂ්‍යත්ව ප්‍රදානයන්ගේ ප්‍රගතිය.</u>

| වර්ෂය | ප්‍රදානය කරන ලද සංඛ්‍යාව ( ප්‍රථම වාරිකය නිකුත් කරන ලද) | 2010.12.31 දිනට පාඨමාලාවන් හදාරන පශ්චාත් උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2010.12.31 දිනට අධ්‍යයන කටයුතු ආරම්භ නොකරන ලද පශ්චාත් උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2010.12.31 දිනට අධ්‍යයන කටයුතු නිම කරන ලද සංඛ්‍යාව | 2010.12.31 දිනට අධ්‍යයන කටයුතු නිම කරන ලද ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2005 | 60 | 26 | 10 | 24 | 40% |
| 2006 | 59 | 29 | 10 | 20 | 34% |
| 2007 | - | - | - | - | - |
| 2008 | 33 | 27 | 01 | 05 | 15% |
| 2009 | 18 | 18 | - | - | - |
| 2010 | 35 | 35 | - | - | - |
| | 205 | 135 | 21 | 49 | 24% |

ශිෂ්‍යත්ව ලාභියකු දර්ශනවේදී උපාධියක් වසර 03 සිට 05 දක්වා කාලසීමාවක් තුල අවසන් කළ යුතු වුවත් 2005 වසරේ ශිෂ්‍යත්ව ලාභීන්ගෙන් 26 දෙනෙකු ප්‍රමාදව පාඨමාලා ආරම්භ කිරීම නිසා 2010 දෙසැම්බර් 31 තෙක් පාඨමාලා අවසන් කරගැනීමට අපොහොසත් වී තිබුණි. ගිවිසුම ප්‍රකාර නියමිත කාලසීමාව තුල අධ්‍යයන කටයුතු අවසන් කරන බවට එකඟ වී තිබුණද ඒ පිළිබඳ ප්‍රමාණවත් පසු විපරමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

ආ) 2005 සිට 2010 දක්වා අධ්‍යයන කටයුතු අවසන් කල ආචාර්‍යයවරු 49 දෙනෙකුගෙන් ආචාර්‍යවරුන් 34 දෙනකු පමණක් සහතික ඉදිරිපත් කරමින් පාඨමාලාව සාර්ථකව නිමකළ බව සනාථ කර තිබුණි.

ඇ) 2010 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යයන කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් ප්‍රදානයන් අවලංගු කළ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 21 ක් වූ අතර ඔවුන්ගෙන් ආපසු අයකර ගැනීමට නොහැකි වූ ශිෂ්‍යත්ව මුදල් ප්‍රමාණය රු. 3,358,823 ක් විය.

ඈ) 2008 - 2012 සංයුක්ත සැලැස්මේ උපාය මාර්ග යටතේ ඉටුකර ගැනීමට සැළසුම් කර තිබූ පහත කාර්යයන් 2010 වර්ෂයේදී ද ඵලදායීව ඉටු කර ගෙන නොතිබුණි.

I. වසරකට අවම වශයෙන් උපාධි ප්‍රබන්ධ 4 ක් මුද්‍රණය කිරීම.

II. විදේශ විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීම තොරතුරු හුවමාරු කර ගැනීම හා බාහිර විද්වතුන් සොයා ගැනීම.

ඊ) ඉලෙක්ට්‍රොනික් පුස්තකාලය

පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට ප්‍රයෝජනය සඳහා ස්ථාපනය කර ඇති ඉලෙක්ට්‍රොනික් පුස්තකාලයෙහි එම පාඨමාලාවන්ට අදාල පොත්පත් හා ලේඛණ ප්‍රමාණවත් පරිදි දත්ත සමුදායකට ඇතුලත් කර නොමැති බැවින් එම පුස්තකාලයෙන් බලාපොරොත්තු වූ සේවය අදාල පාර්ශවයන් වෙත ලබා ගැනීමට නොහැකි වී තිබුණි. පුස්තකාලයේ සේවය සඳහා පත්කර ඇති පුස්තකාලයාධිපති හා පුස්තකාල සහකාරවරු දෙදෙනකු සඳහා 2010 වර්ෂය තුල වැටුප් වශයෙන් ගෙවා ඇති රු 856, 395 ක් හා එම අන්තර්ජාල සම්බන්ධතාවය වෙනුවෙන් වාර්ෂිකව දරනු ලබන නඩත්තු වියදම රු 487,747 ක් නිශ්කාර්‍ය්‍ය වියදමක් බවට පත්ව තිබුණි.

## 2:3. කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මධ්‍යස්ථානයේ මූල්‍යමය ශක්තිය ගොඩනැංවීම සඳහා විදේශ මුදල් හා වෙනත් වෘත්තීය සංස්කරණ මඟින් මුදල් එක් රැස් කිරීම සඳහා සැලසුම් සකස් කරන ලෙසට 2008 පෙබරවාරි 07 දින ආයතනයේ ප්‍රගති සමාලෝචන කොමිෂන් වාර්තාව මඟින් උපදෙස් ලබා දී තිබුණ ද ඒ සඳහා සක්‍රීය වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). 2006 වර්ෂයේ සිට ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන එන ලද රු 60,000 ක්වූ ගෙවිය යුතු ප්‍රකාශණ වියදම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද නිරවුල් කිරීමට හෝ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ)  2010 වර්ෂය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන රු 1,488,000 න් රු 906,135 ක් එනම් 61% ක් වැය නොකර ඉතිරිව තිබූ  අතර මෙම මුදල "වැය නොකළ ප්‍රාග්ධන වියදම්" නම් ගිණුමක රඳවා ගෙන තිබුණි

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ).  බඳවා ගැනීම්.

(ආ).  ශිෂ්‍යත්ව ප්‍රදානය.

(ඇ).  ආදායම් රැස් කිරීම.

(ඈ).  පුස්තකාල පරිපාලනය